<u>ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා අයදුම්කරුට උපදෙස්.</u>
(රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා ව්‍යාපාර ලියාපදිංචි කටයුතු කල නොහැකි බව කාරුණිකව දන්වමි.)

එම ව්‍යාපාර නාමයට,

- ✶ සත්‍ය සම්පූර්ණ නම් වලින් හෝ සමූහ නාමවලින් ව්‍යාපාරයක් ආරම්භ කල නොහැක.
- ✶ ව්‍යාපාරිකයාගේ ජනාධිපති/ජාතික/රාජ්‍ය/ශ්‍රී ලංකාව හඟවන හෝ අදහස් කරන වචන
- ✶ වෙනත් රටවල නම් රාජ්‍ය දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන හෝ සමාගම් පළාත් ආයතන(ආණ්ඩු)
- ✶ ජාතියට හෝ ආගමට නොගැලපෙන්නාවූ අර්ථ දක්වන ආචාර සම්පන්නභාවයට ප්‍රතිපක්ෂ මානව සමාජ සුභ සාධනයට අහිතකර හැඟවීම හෝ අර්ථ හඟවන වචන
- ✶ ව්‍යාපාර නාම පරිවර්තන
- ✶ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක යහපතට අහිතකර බලපෑම් හෝ වෙනත් විදිහකට අයෝග්‍ය වචන ඇතුළත් කල නොහැකි බව දන්වමි.

<u>ආකෘතිපත්‍ර සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්</u>

- ✶ තනි පුද්ගල ව්‍යාපාරයක් නම් NWP/C/B/N/3 ආකෘතියද, හවුල් ව්‍යාපාරයක් නම් NWP/C/B/N/4 ආකෘතියද සම්පූර්ණ කර අත්සන සහිතව ලබාදීම
- ✶ හවුල් ව්‍යාපාරයක් නම්,හවුල් ගිවිසුම හා සියළුම හවුල් කරුවන්ගේ අත්සන්,දිවුරුම් ප්‍රකාශයක් අවශ්‍ය වේ.
- ✶ සම්පූර්ණ කරන ලද ග්‍රාම නිලධාරී වාර්තාව
- ✶ ව්‍යාපාර හිමිකරුගේ/හිමිකරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත ග්‍රාම නිලධාරි සහතික කල
- ✶ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ ප්‍රාදේශීය සභා බල පදේශයේ නම් ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හා ගෙවීම් කුවිතාන්සිය
- ✶ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නගර සභා බල පදේශයේ නම් නගර සභාවෙන් ලබාගත් වෙළඳ බලපත්‍රය හා ගෙවීම් කුවිතාන්සිය
- ✶ දේපල අයිතිය තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් ලියවිල්ලක්
- ✶ ව්‍යාපාර ස්ථානයට අදාල නීත්‍යානුකූලව හිමිවන ඔප්පුව(ඔප්පුවේ පිටපත ග්‍රා.නි. සහතික කර/බැංකුවකට උගස් කර ඇත්නම් ඔප්පුවේ පිටපත බැංකුව සහතික කර ඒ සමඟ ව්‍යාපාරය කිරීමට විරෝධතාවක් නොමැති බවට ප්‍රකාශිත ලිපිය)
- ✶ අයිතිකරු වෙනත් තැනැත්තකු වනවිට ඔහු/ඇයට මෙම ස්ථානයේ ව්‍යාපාරය කරගෙන යාම පිළිබඳ විරුද්ධත්වයක් නොමැති බවට දේපල හිමිකරු විසින් ග්‍රා.නි. ඉදිරිපිට අත්සන් කල ප්‍රකාශය
- ✶ උගස් බදු දේපල සම්බන්ධයෙන් උගස්/බදු ගිවිසුම
- ✶ මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාව (ආහාර ද්‍රව්‍ය/මහජන සෞඛ්‍යයට අහිතකර බලපෑමක් ඇතිවන ව්‍යාපාර සඳහා
- ✶ මැණික් හා ස්වර්ණාභරණ - මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ බලපත්‍රය
- ✶ දැව - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බලපත්‍රය
- ✶ වැලි/ගල්/පස්/බොරළු - භූ විද්‍යා පතල් කැණීම් කාර්යංශයේ බලපත්‍රය
- ✶ පරිසර බලපෑම් ඇතිවන ව්‍යාපාර සඳහා - පරිසර බලපත්‍රය
- ✶ ආරක්ෂක සේවය - පොලිස් වාර්තාව
- ✶ අධ්‍යාපන ආයතන - අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන ලියවිලි / වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරියේ අනුමැතිය
- ✶ ඖෂධ - ඖෂධවේදී සහතිකය හා නි.ප.සෞ.සේ. අධ්‍යක්ෂකගෙන් ලත් සුදුසුකම් වාර්තාව
- ✶ පෞද්ගලික වෛද්‍ය ආයතන - වෛද්‍ය රසායනාගාර,විශේෂඥ සේවා මධ්‍යස්ථාන,පෞද්ගලික රෝහල්) - සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි සහතිකය
- ✶ කොන්ත්‍රාත් ව්‍යාපාර - TO ENGINEER මහතා ව්‍යාපාරයේ වැඩ කරන බවට ලිපිය හා සුදුසුකම් සනාථ කරන සහතික
- ✶ ව්‍යාපාරයේ නම යෙදූ නාම පුවරුවක් ප්‍රදර්ශනය කල යුතුය.
- ✶ සියළුම ඡායා පිටපත් අදාල ග්‍රාම නිලධාරි මහතා /මහත්මිය විසින් සහතික කර තිබිය යුතුයි.

සියළුම ලියවිලි සම්පූර්ණ වීමෙන් පසු ක්ෂේත්‍ර පරික්ෂණය සිදුකර නිර්දේශය ලබා ගැනීම සඳහා 071-9232924 (ඉන්දු මිස්) දුරකථන අංකයට දැනුම් දිය යුතුයි.

- ✶ ව්‍යාපාරය ආරම්භකර දින 30 ක් ඇතුලත ලියාපදිංචි ගාස්තුව (තනි-රු.4000/- හවුල් - රු.5000/-)
- ✶ දින 30 ඉක්මවූ පසු එක් මසකට හෝ කොටසකට රු.150/- ක දඩ මුදලක් අය කරන අතර වසරකට උපරිම රු.1650/- කි.

CamScanner